# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2112/16 - 2019 පෙබරවාරි මස 26 වැනි අඟහරුවාදා - 2019.02.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(1අ) වගන්තිය යටතේ මහරගම නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන මහරගම නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ මහරගම නගර සභාවේ අංක 11 කොට්ටාව බටහිර කොට්ඨාසයට තේරී පත් වූ ලක්මිණි තුෂාරි ගුණවර්ධන අයත්වන්නා වූ අංක 02 දරන ස්වාධීන කණ්ඩායමේ නායකයාට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති 8 වගන්තිය යටතේ සුදුසුකම් ලබන අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම ස්වාධීන කණ්ඩායමට අයත් වන්නා වූද, එම මහරගම නගර සභාවේ අංක 11 කොට්ටාව බටහිර කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී ස්වාධීන කණ්ඩායම් අංක 02 හි කණ්ඩායම් නායක විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ගනේගොඩ හපුතන්ත්‍රීගේ සරෝජිනී නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

මහරගම නගර සභාවේ තේරීම්භාර නිලධාරී සුදු දේවගේ ශානික අනුරුද්ධ රූපසිංහ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(1අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ගනේගොඩ හපුතන්ත්‍රීගේ සරෝජිනී මහරගම නගර සභාවේ අංක 11 කොට්ටාව බටහිර කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. ඩී. එස්. ඒ. රූපසිංහ,
තේරීම්භාර නිලධාරී,
මහරගම නගර සභාව.

2019 පෙබරවාරි මස 25 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කොළඹ.

03 - 601

1A - G 29538 — 27 (2019/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*